## කෘෂිකර්ම සංගණනයේදී භාවිතා කරනු ලබන උපලේඛන හා එහි අදියරවල් පිළිබඳ විස්තර

### නියමු සංගණනය:

කෘෂිකර්ම සංගණනයේදී ඇතිවිය හැකි ප්‍රශ්න පිටු දැකීම සඳහා, ඒ පිළිබඳව අවබෝධයක් ලබාගැනීම සඳහාත්, සංගණනයේදී භාවිතා කරනු ලබන උපලේඛන ක්ෂේත්‍රයේදී පරීක්ෂා කර බැලීම සඳහාත්, නියමු සංගණනයක් පවත්වනු ලැබේ. මෙහිදී දිවයිනේ සෑම ප්‍රා.උ.දි. කොට්ඨාශයකම තෝරා ගන්නා ලද එක් ජන සංගණන කාණ්ඩයක් තුල ගොවිකාණ්ඩ 10 ක් වෙනුවෙන් තොරතුරු එක් රැස් කරනු ලබන අතර සංගණනයේදී භාවිතා කිරීමට නියමිත සියලුම උපලේඛන භාවිතා කරනු ලැබේ.

### 02 අවසාන සංගණනය:

මෙය අදියර දෙකකින් සමන්විත වේ.

පලවෙනි අදියර: ගණන් ගන්නා නිලධාරියා විසින් පළමුවෙන්ම තමන්ගේ ගණන් ගැනීමේ කොට්ඨාශය තුල සියලුම ගොවි කාරකයින් ලැයිස්තු ගතකළයුතුය. මේ සඳහා කෘ.සං. 1 උපලේඛණය භාවිතා කරනු ලැබේ. එක් ගණන් ගන්නා නිලධාරියෙකුට ග්‍රාමසේවක කොට්ඨාශයක් තුල පිහිටි සියලුම නිවෙස් වලට යාමට සිදුවන අතර එහි තුල පදිංචි සියලුම ගොවි කාරකයින් ලැයිස්තු ගත කිරීමට සිදුවේ. ඒ අතරම කෘ.සං. 2 මගින් ගොවි කාරකයින් හා ගොවි කාණ්ඩ පිළිබඳ තොරතුරු ද එක්රැස් කළයුතු වේ.

දෙවෙනි අදියර: පළමුවැනි අදියරේදී ලැයිස්තු ගත කරන ලද ගොවි කාණ්ඩ අතුරින් 10% ක නියැදියක් තෝරා ගනු ලබන අතර එම ගොවි කාණ්ඩ වලට අදාල සවිස්තර තොරතුරු බිම් කැබලි මට්ටමින් (එක් ගොවි කාණ්ඩයක් බිම් කැබලි කිහිපයකින් සමන්විත විය හැකිය)

කෘ.සං. 3උපලේඛනයේ එක්රැස් කළයුතු වේ.

අදාල උපලේඛන හා උපදෙස් පත්‍රිකා ද මෙයට යා කර ඇත.